සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**06 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය

**කාලය පැය එකයි විනාඩි තිහයි**

**නම හා විභාග අංකය :**

සැලකිය යුතුයි :- ● මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

● **ප්‍රශ්න අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු 4 ක් ලබාදී ඇත. වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.**

01. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව මෙරටට පරිත්‍යාග කරන ලද්දේ කුමන රටකින් ද?
    1. ජපානය 2. චීනය 3. මැලේසියාව 4. ඉන්දියාව

02. මිනිසා විසින් නිර්මාණය කරන ලද සම්පතකි.
    1. ජලය 2. වනාන්තර 3. ඛනිජ සම්පත් 4. වීදුරු

03. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග කීයක් තිබේද?
    1. 3 02. 4 03. 5 4. 6

04. සාමූහිකව වැඩ කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක් ද?
    1. සංස්කෘතිය සුරැකීම. 2. සමඟිය ගොඩනැගීම.
    3. විශ්වාසය රැකීම 4. සාර්ථකත්වය බිඳවැටීම.

05. පාසලේ ඉතිහාසය සොයා ගැනීමට උපකාරී වන ලේඛනයකි.
    1. පංති වාර්තා පොත 2. ශිෂ්‍ය නාම ලේඛනය
    3. ලොග් සටහන් පොත 4. පෙළ පොත

06. ක්‍රි.ව. 1931 දී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා වූයේ කවුද?
    1. ඊ.ඒ. නුගවෙල මහතා 2. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා
    3. ඊ.එම්.අයි. ඊරියගොල්ල මහතා 4. ජේ.ආර්. ජයවර්ධන මහතා

07. මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය කුමක් ද?
    1. රාජ්‍ය ඖෂධ ප්‍රතිපත්තිය හඳුන්වාදීම.
    2. ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා වීම.
    3. ශල්‍ය වෛද්‍ය විද්‍යාවට පිදෙන රන් පදක්කම හිමිකර ගැනීම.
    4. ශ්‍රී ලංකාවේදී සහසිකයෙකු අතින් මරණයට පත්වීම.

08. සැලසුම් සහගත ශිෂ්‍යයා සැමවිටම පහත සඳහන් අයුරින් ක්‍රියා කරනු දක්නට ලැබේ.
    1. තම අරමුණු ඉටුකර ගනී. 2. වැඩ කල් දමයි.
    3. අත්‍යවශ්‍ය පියවර අත්හැර දමයි. 4. අභියෝග වලින් පලා යයි.

09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක් වීමෙන් ගොඩනැගෙන පරිපාලන ඒකකය දිස්ත්‍රික්කයක් වේ. එම දිස්ත්‍රික්කයේ ප්‍රධානියා කවුද?
    1. ප්‍රාදේශීය ලේකම්වරයා 2. දිස්ත්‍රික් ලේකම්වරයා
    3. අමාත්‍යාංශ ලේකම්වරයා 4. පළාත් ආණ්ඩුකාරවරයා

10. ශ්‍රී ලංකාවේ පළාත් 9 අතරින් භූමි ප්‍රමාණයෙන් විශාලතම පළාත කුමක් ද?
    1. උතුරු පළාත 2. බස්නාහිර පළාත 3. මධ්‍යම පළාත 4. උතුරු මැද පළාත

● **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.**

11. වැඩිම දිස්ත්‍රික්ක ගණනක් එකතු වී තිබෙන පළාත උතුරු පළාතය.

12. ප්‍රතිචක්‍රීයකරණය මගින් සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකිය.

13. රජය පනවන නීති රීති ආරක්ෂා කිරීමට, සාමය රැකීමට, අපරාධ වැළැක්වීමට වැනි සහන සැලසීම සඳහා ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේ අපට සහය වේ.

14. නගරයේ ඇති වීදි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම ප්‍රාදේශීය සභාවක කාර්යභාරය වේ.

15. මිනිසෙකු තුළ හොඳ විනයක් හා ශික්ෂණයක් ඇති කිරීමට නම් ප්‍රගුණ කළ යුතු ගුණාංග රැසක් ඇත.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. පොදුවේ සැමට පරිහරණය කළ හැකි සියලුම දෑ ........................................................ යනුවෙන් හැඳින්වේ.

17. ශබ්ද විකාශන යන්ත්‍රවලින් නිකුත් කෙරෙන අධික ශබ්දය නිසා ................................................................. සිදුවේ.

18. අවුකන බුදු පිළිමය ........................................................ දිස්ත්‍රික්කයේ කලාවැව සමීපයෙහි පිහිටා ඇත.

19. පාසලක ප්‍රධාන අරමුණ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට .................................................... අධ්‍යාපනයක් ලබාදීමයි.

20. ජංගම දුරකථන හා අන්තර්ජාලය අනිසි ලෙස භාවිතය නිසා පාසල් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය හා ............................... පිරිහී ඇත.

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(01) i පාසලකට සම්බන්ධ වන පාසල් ප්‍රජාව කවරහු ද? (ල. 03)
ii සමාජයෙන් පාසලට සැලසෙන සේවාවන් 4 ක් ලියන්න. (ල. 04)
iii පාසල් සංවර්ධන කමිටුවේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ල. 05)

(02) i ඔබ ජීවත්වන ප්‍රදේශයේ ඇති සමිති 03 ක් නම් කරන්න. (ල. 03)
ii ඉන් එක් සමිතියකින් ඔබට හෝ ඔබ ප්‍රදේශයට සිදුවන සේවාවන් 4 ක් ලියන්න. (ල. 04)
iii යහපත් පුරවැසියෙකු වශයෙන් අප තුළ තිබිය යුතු ගුණාංග දෙකක් විස්තර කරන්න. (ල. 05)

(03) i. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| දේශීය නිෂ්පාදනය | ප්‍රසිද්ධ ස්ථානයේ නම |
|---|---|
| වෙස් මුහුණු කර්මාන්තය | |
| පිත්තල භාණ්ඩ කර්මාන්තය. | |
| මැණික් කර්මාන්තය | |

(ල. 03)

ii. අතීත ශ්‍රී ලංකාවේ පැවති වාරි තාක්ෂණයට නිදසුන් ලෙස දැක්විය හැකි පහත සඳහන් වැව් ඉදිකළ රජවරුන්ගේ නම් ලියන්න.

| වැව් | කරවූ රජතුමා |
|---|---|
| 1. කලා වැව | |
| 2. පරාක්‍රම සමුද්‍රය. | |
| 3. මින්නේරි වැව. | |
| 4. කන්තලේ වැව. | |


(ල. 04 )

iii. ශ්‍රී ලංකාවේ දේශීය සංස්කෘතිය අතීතයේ ඉතා හොඳින් පෝෂණය වී පැවති ආකාරය නිදසුන් මගින් විස්තර කරන්න. (ල. 05)

(04) i. පාසලක පවතින පොදු නීති රීති 03 ක් නම් කරන්න. (ල. 03)
ii. පාසලකට නීති රීති පද්ධතියක් අවශ්‍ය ඇයි දැයි? පැහැදිලි කරන්න. (ල. 04)

iii. ඔබගේ පාසලේ අනන්‍යතාවය පිළිබිඹු කරන සංකේතයක් නම් කර එහි ඇති සංකේත වලින් පිළිබිඹු කරන දෑ මොනවාදැයි විස්තර කරන්න. එය තම පාසලේ සංස්කෘතියට අයත්වන ආකාරය පෙන්වා දෙන්න. (ල. 05)

(05) i. පහත සඳහන් ගැලීම් සටහන සම්පූර්ණ කරන්න. (ල. 03)




ii. පරිසරයේ ඇති භෞතික සම්පත් බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙකට බෙදා ඒවාට නිදසුන් දෙක බැගින් සපයන්න. (ල. 04)

iii භෞතික සම්පත් සංරක්ෂණය කරගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

# තෙවන වාර පරීක්ෂණය - 2019
# පුරවැසි අධ්‍යාපනය

06 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | |
|---|---|
| 01 - 2 | 11 - ✓ |
| 02 - 4 | 12 - ✓ |
| 03 - 1 | 13 - ✗ |
| 04 - 3 | 14 - ✗ |
| 05 - 3 | 15 - ✓ |
| 06 - 2 | 16 - පොදු දේපළ |
| 07 - 4 | 17 - ශබ්ද දූෂණය |
| 08 - 1 | 18 - අනුරාධපුර |
| 09 - 2 | 19 - ගුණාත්මක |
| 10 - 4 | 20 - විනය |

## II කොටස

(01) i.
- විදුහල්පති හා ආචාර්ය මණ්ඩලය
- ශිෂ්‍යයන්
- සුභපතන්නන්
- එම පාසලේ දරුවන්ගේ දෙමාපියන්
- ආදි ශිෂ්‍යයන්
- පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයින් (ල. 03)

ii. 1. පාසලේ සංවර්ධන කටයුතුවලට සහයවීම.
2. පාසල සතු දේපල ආරක්ෂා කිරීම.
3. සංවිධානවලින් විවිධ සේවා ලබාදීම.
4. පාසලේ විවිධ උත්සව වලට සහභාගී වීම.
5. නවීන තාක්ෂණය හා ශිල්ප ක්‍රම පිළිබඳව පාසල දැනුවත් කිරීම. (ල. 04)

iii.
- දෙමව්පියන්, ආචාර්ය මණ්ඩලය, ආදි ශිෂ්‍යයන් හා කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙකුගෙන් සමන්විත කමිටුව ගැන විස්තර කිරීම.
- විදුහල්පතිවරයා එහි සභාපතිවරයා වීම.
- පාසලේ පවතින ගැටළු හා ප්‍රශ්න විසඳා ගැනීමට කටයුතු කිරීම.
- පාසලේ සංවර්ධනය හා දියුණුවට කටයුතු කිරීම. (ල. 05)

(02) i. ක්‍රීඩා සමිති/ ණය දෙන සමිති / ධීවර සමිති / ග්‍රාම සංවර්ධන සමිති/ ගොවි සමිති/ ආදී 03 ක් සඳහා ලකුණු ලබා දෙන්න.

ii.
- නම් කරන ලද සමිතිය අනුව තේමාවන් 4 ක් නම් කර ඇත්නම් ලකුණු 4 ක් ලබා දෙන්න.(ල. 04)

iii.
- ආචාරශීලීව කථා කිරීම.
- අන්මත ගරු කරමින් සාකච්ඡා කිරීම.
- අන් අයගේ සංස්කෘතිය අගය කිරීම හා ගරු කිරීම.
- මනා විනයක් හා ශික්ෂණයකින් කතා කිරීම
- සරු නිසරු දේ හොඳින් හඳුනාගැනීම.
- සම්ප්‍රදායන් හා නීති රීතිවලට ගරු කිරීම.
- පොදු දේපළ සුරකීම. (ල. 05)

(03) i.
- අම්බලන්ගොඩ
- පිළිමතලාව
- රත්නපුරය (ල. 03)

ii.
- ධාතුසේන රජතුමා
- මහා පරාක්‍රමබාහු රජතුමා
- මහසෙන් රජතුමා
- දෙවන අග්බෝ රජතුමා (ල. 04)

iii.
- ආගම් සහ ආගමික උත්සව පැවති ආකාරය
- ආගම් ඇසුරින් නිර්මාණය වූ විශේෂ කලා නිර්මාණ
- පූජනීය ස්ථාන
- පිළිම, දාගැබ්, සිතුවම්, ගල් කැටයම් හා විවිධ ගෘහ නිර්මාණ

- සාහිත්‍ය කෘති හා ජන සාහිත්‍ය
- දේශීය වෙදකම හා දේශීය සිරිත් විරිත්
- වාරි සංස්කෘතිය හා ඊට අදාල වැව් අමුණු බිහිවීම. (ල. 05)

(04) i.
- දිනපතා පාසලට පැමිණීම
- පාසල ආරම්භ කිරීමට පෙර පාසලට පැමිණීම.
- නියමිත නිල ඇඳුමෙන් සැරසී පාසලට පැමිණීම.
- පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම.
- කාල සටහනට අනුව පාසලේ රැඳී සිටීම
- නායකත්වයට අවනත වීම.
- පාසලේ සංස්කෘතියට ගෞරව කිරීම හා පාසලේ සම්ප්‍රදායයන් ආරක්ෂා කිරීම (ල. 03)

ii.
- පාසල තුළ හොඳ ඉගෙනුම් වාතාවරණයක් ගොඩනැගීම සඳහා.
- පාසල ක්‍රමවත්ව පාලනය කිරීම සඳහා
- ළමයින් විනයගරුක පුද්ගලයින් බවට පත් කිරීම සඳහා
- පාසලේ සියලුම දෙනාගේ අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කිරීම.
- පාසලේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට. (ල. 04)

iii. ඔබගේ පාසලේ අනන්‍යතාවයට පාසල් ගීතය/ පාසල් කොඩිය/ පාසල් ලාංඡනය/ පාසලේ ආදර්ශ පාඨය යන මේවායින් එකක් පිළිබඳව විස්තර කිරීම අනුව ලකුණු 5 ක් ලබාදෙන්න.

(05) i. A - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
B - දිස්ත්‍රික්කය
C - පළාත

ii. ස්වභාවික සම්පත් - හිරු එළිය, පිරිසිදු වාතය, පස, කඳු, වනාන්තර
ස්වභාවික නොවන සම්පත් - යාන වාහන, ගොඩනැගිලි, කර්මාන්ත ශාලා

iii. වනාන්තර, ජලය, හිරු එළිය, පස ආදිය විනාශ නොකර ආරක්ෂා කර ගන්නා ආකාරයත් අනාගත පරපුරට එය ඉතිරිකර ප්‍රයෝජනය ගන්නා ආකාරයත් නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් ලකුණු 5 ම ලබාදෙන්න.